**ශීර්ෂය 277 - මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 277 - මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023දෙසැම්බර් 31 දිනට මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනුලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) හානි හා පාඩු වාර්ථා නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මොනරාගල ප්‍රාදේශිය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල වෙත 2023 ඔක්තෝබර් 17 දින අකුණු සැර වැදීම නිසා ගොඩනැගිල්ල, විදුලි පද්ධතිය හා පරිගණක හා උපාංග හානියට පත්වී රු.9,864,197 ක අලාභයක් සිදුවී තිබුණද, 2023 මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් උපලේඛනයේ රු.7,826,000ක් ලෙස දැක්වීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හානි හා පාඩු රු.2,038,197ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. ලේඛනගත කිරීමට කටයුතු කරමි. | හානි හා පාඩු නිවැරදිව තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කලයුතුය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | 2022 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණ රු.2,403,558,971ක් වුවත්, සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු. 2,080,222,407ක් ලෙස දැක්වීමෙන් ආරම්භක දේපල පිරියත හා උපකරණ ශේෂය හා දේපල පිරියත උපකරණ සංචිතය රු.323,336,564ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළයුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රු.106,867,541ක්වූ කාර්යාල ගොඩනැගිලි, ඉඩම, රජයේ නිවාස, සන්නිවේදන උපකරණ, පරිගණක හා උපාංග, ලී බඩු, කෘෂිකාර්මික උපකරණ හා විදුලි උපකරණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා නොතිබීමෙන් දේපල පිරියත හා උපකරණ සහ දේපල පිරියත උපකරණ සංචිතය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් එකතුව රු.33,500,000ක් වූ මගී ප්‍රවාහන රථ (Pasenger Vehical) 05ක් හා එකතුව රු.25,380,000ක් වූ කෘෂිකාර්මික වාහන 23ක් දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබීමෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ හා දේපල පිරියත උපකරණ සංචිතය රු.58,880,000ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අයිතිය ඇති වාහන සියල්ලෙහි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කලයුතුය. |
| **(iv)** | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැල්ලවාය හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ඉදිකර තිබූ රජයේ නිවාස හා මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු පරිපාලන නිලධාරී නිල නිවාසය හා එය පිහිටි ඉඩම තක්සේරු කර එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුලත්කර නොතිබුණි. | පිළිගනිමි. | නිල නිවාස වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කලයුතුය. |

**(ඇ) විගණන සාක්ෂි නොවීම**

| | **නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11කට අදාලව දේපල පිරියත උපකරණ යටතේ දක්වා තිබූ කාර්යාල උපකරණ, පරිගණක හා උපාංග, විදුලි උපකරණ, සන්නිවේදන උපකරණ, කෘෂිකර්ම හා පශු සම්පත් උපකරණ, ලී බඩු උපකරණ හා යන්ත්‍ර උපකරණ සඳහා වූ එකතු වටිනාකම රු.341,877,791ක් සඳහා උපලේඛන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | New Cigas වැඩසටහන මගින් ලබාගන්නා ලද Bos Report හි මෘදුකාංග පිටපත් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | උපලේඛන ඉදිරිපත් කලයුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරයේ එස්.ඒ 82 ආකෘති අනුව දේපල පිරියත හා උපකරණ ආරම්භක ශේෂයට රු.6,900,000ක් එකතු කිරීම් හා රු.10,220,000ක් ඉවත් කිරීම් සිදුකර තිබුණද, ඒවා තහවුරු කිරීම් සඳහා ලිඛිත සාක්ෂි කිසිවක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිදුවී තිබූ ද්විගණන දෝෂ නිවැරදි කර ඇත. | ඉවත්කිරීමේ හා එකතු කිරීම් සඳහා උපලේඛන ඉදිරිපත් කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | මොනරාගල දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා ආහාර මළු 30,283ක් බෙදාහැරීම සඳහා රු.3,513,127ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වැයකර තිබූ අතර, මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ උපදෙස් ප්‍රකාරව ආහාර සුරක්ෂිතතාව අවම අඩු ආදායම්ලාභී පවුල් ඒකකයන් තෝරාගැනීම නිර්නායක 11ක් යටතේ සිදුකල යුතු බව දක්වා තිබුණද, ප්‍රතිලාභීන් 30,283ක් තෝරාගැනීමේදී භාවිතා කල නිර්නායකයන්ගේ නිවැරදිතාවය තහවුරු කිරීම සඳහා සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | වසමක් සඳහා කොළ 5-10ත් අතර, සංඛ්‍යාවක් භාවිතාකර තිබූ නිසා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තොරතුරු රැස්කරගෙන තබාගෙන නොමැත. | ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී ඔවුන් ඒ සඳහා යෝග්‍ය බවට සහතික කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කලයුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අභාවයට යමින් පවතින සෙරමික් කර්මාන්තය නඟා සිටුවීමේ අරමුණින් 2014 වර්ෂයේ කොවුල්ආර සෙරමික් ගම්මානය ආරම්භකර, ජාතික ශිල්ප සභාවේ ග්‍රාමීය හා සම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන යටතේ 2021 හා 2022 වර්ෂවලදී ව්‍යාපෘති 06ක් සඳහා රු.4,187,281ක් වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වගකිවයුතු නිසි නිලධාරියෙකුගේ අවධානය යොමුවී නැත. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේ මගින් නම්කරන ව්‍යවසායකයෙකු සම්බන්ධකර ගනිමින් ඉදිරි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කලයුතුය. |
| (ආ) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2018 ජූලි 02 දිනැති අංක 2018/07 චක්‍රලේඛයේ 07 වන වගන්තියේ 02 වන ඡේදය ප්‍රකාරව උපරිම ආයෝජන කළඹෙහි ප්‍රතිශතයන්ට අනුව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම් සිදුකල යුතු වුවත්, මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09ක සමෘද්ධි ප්‍රජාමූල බැංකු විසින් රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු 218ක රු.1,124,670,498ක් ආයෝජනය කර පැවතියද, උපරිම පොලී ප්‍රතිශතයක් ගෙවන බැංකුවල ආයෝජන සිදුනොකිරීමෙන් පොලී ආදායම වශයෙන් ලැබිය යුතු රු.10,180,800ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමෘද්ධි ප්‍රජාමූල බැංකු වෙත අහිමි වී තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර ආයෝජනය කිරීමට උපදෙස් ලබාදී ඇත. | උපරිම ප්‍රතිලාභ ලැබෙන ලෙස ආයෝජන කිරීමට කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | **i.** ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය මගින් චක්‍රීය ණය වැඩසටහන යටතේ ලබාදෙන ණය මුදල් මාසික වාරික 10 කින් ගෙවා නිමකල යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ලබාදී තිබූ රු.11,015,879ක් වූ චක්‍රීය ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු රු.4,338,842ක් වූ හිඟ ණය මුදල හා රු.414,329ක් වූ හිඟ පොලිය වශයෙන් එකතුව රු.4,753,171ක මුදලක් තවදුරටත් අයවීමට තිබුණි. | හිඟ ණය අයකරගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ ණය මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කලයුතුය. |
| | **ii.** සෞභාග්‍ය සංවර්ධන කාර්යාංශයේ 2022 ජූනි 28 දිනැති අංක **SDB/SPY/GS/**2022/චක්‍රලේඛය ප්‍රකාරව සක්‍රියව පවතින ග්‍රාමශක්ති මව් සමිතිවල පවතින මුදල් ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන සඳහා අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා හා සමිති සාමාජිකයින් සඳහා අවශ්‍ය අනෙකුත් වැඩසටහන් සඳහා යොදාගත හැකි බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්කයේ ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය යටතේ පවතින සමිති 125කට අදාල මව් සමිතිවල රු. 77,515,991ක්ද, ක්ෂුද්‍ර මූල්‍ය ගිණුම්වල රු.6,653,272ක්ද, වශයෙන් රු.84,169,263ක් වූ අරමුදල් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ග්‍රාමශක්ති ජනතා සමිති අක්‍රීය තත්ත්වයේ පවතින අතර, අරමුදල් ඵලදායීව භාවිතා කිරීමට නිලධාරීන් කටයුතු කරයි. | ගිණුම්වල පවතින අරමුදල් ඵලදායීව අරමුණු සඳහා උපයෝජනය කරගතයුතුය. |
| (ඇ) | කෘෂිකර්ම වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන යටතේ වෙහෙරයාය රන්ලිය ව්‍යවසායකත්ව සංවර්ධන පදනම සඳහා රටකජු සැකසුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.1,925,569ක වටිනාකමකට 2020 ඔක්තෝබර් 14 දින ග්‍රාමීය වැඩිහිටි සංවිධානයක් වෙත පවරා තිබුණු අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකල එම ගොඩනැගිල්ල 2023 ජූනි 19 දින රන්ලිය ව්‍යවසායකත්ව පදනම වෙත පවරා තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අරමුණුගත කාර්ය සඳහා යොදාගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන සතුය. | මධ්‍යස්ථානය අරමුණුගත කාර්ය සඳහා යොදා ගැනීමට කටයුතු කලයුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | | |
| | | **රු.** | | | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | | |
| (i) | **XIX පරිච්ඡේදයේ 6.1 වගන්තිය** | - | යම්කිසි තනතුරකට වෙන්කරන ලද නිවාස හැර අනෙකුත් සියළුම නිවාසවල බදු කාල සීමාව වර්ෂ 05කින් අවසන්විය යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02කට අදාල රජයේ නිවාස 05ක පදිංචි වී සිටි නිලධාරීන් 05ක් ගිවිසුම්ගත කාලය අවසන් වී අදාල නිවාසවල පදිංචි වී සිටීම නිසා පොරොත්තු ලේඛනයේ සිටින නිලධාරීන් 44ක් අතරින් සුදුසුකම් සපුරන ලද නිලධාරීන් වෙත නිවාස ලබාදීමට නොහැකිව පැවතුණි. | නිල නිවාස 05 කඩිනමින් පවරාගැනීමට කටයුතු කරමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළයුතුය. |
| (ii) | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 04 වගන්තිය | 1,737,408 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව, සේවය අත්හිට වූ, සේවය අත්හැරගිය, මියගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 10කගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් වර්ෂ 02 ක සිට වර්ෂ 20ක් දක්වා කාල පරාසයක් ගතවී තිබුණද, හිඟ ණය ශේෂ අයකරගැනීමට පියවර ගෙන නොතිබුණි. | විවිධ අඩුපාඩු නිසා අයකරගැනීම ප්‍රමාද වී ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළයුතුය. |

(ආ) ශ්‍රීලංකාප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | | | |
|---|---|---|---|---|
| **මුදල් රෙගුලාසි 571** | 49,099,014 | තැන්පත් කල දින සිට වර්ෂ 02 ඉක්මවූ තැන්පතු නියාදනය කල යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07කට අදාල තැන්පතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | වසර 02 ඉක්මවූ තැන්පතු නියාදනයට කර නැත. | වසර 02 ඉක්මවූ තැන්පතු හඳුනාගෙන නියාදනය කිරීමට කටයුතු කලයුතුය. |

## 2.3 වංචනික ස්වරූපයේ ගනුදෙනු

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උමාඔය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අත්පත්කරගෙන තිබුණු ඉඩම් කැබලි 03ක් වෙනුවෙන් ප්‍රධාන තක්සේරුව ලැබෙන තෙක් ඉඩම් අත්පත් කර ගැනීමේ අත්තිකාරම් ලෙස රු.850,000ක් 2013 වර්ෂයේදී ප්‍රතිලාභීන් දෙදෙනෙකු වෙත ගෙවා තිබූ අතර 2014 දෙසැම්බර් 04 දින එම ඉඩම් කැබලි වල ප්‍රධාන තක්සේරු වටිනාකම රු.1,350,000ක් ලෙස තීරණය කර 2015 පෙබරවාරි 09 දින 2013 වර්ෂයේ ගෙවූ අත්තිකාරම් මුදල අඩුකර නොගෙන සම්පූර්ණ තක්සේරු වටිනාකම වූ රු.1,350,000ක් ගෙවා තිබුණි. ඒ අනුව වැඩිපුර ගෙවූ රු.850,000ක මුදල අයකර ගැනීමට වැල්ලවාය දිසා අධිකරණයේ 2018 නොවැම්බර් 19 දින **M**11836 නඩුව පවරා තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර 08ක් ගතවී තිබුණද, එම මුදල අයකරගැනීමට නොහැකි වී තිබුණි. ඒ අනුව එම ගෙවීම් සිදුකල වගකිවයුතු නිළධාරීන්ගෙන් අදාල මුදල අයකරගැනීමට ද කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තු පරීක්ෂණයක් පවත්වන අතර, අවසන් වාර්තාව කඩිනමින් ඉදිරිපත් කරමි. | වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු අයකර ගතයුතුය. වැඩිපුර ගෙවීමට සිදුකරන ලද වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහන දෙකක් අපහරණය කිරීම සඳහා සාමාජිකයින් 04කගෙන් යුත් කමිටුවක් පත්කර තිබූ අතර, එම වාහන දෙක පිළිවලින් රු.40,000ක් හා රු.150,000ක් වශයෙන් ඉතා අඩු වටිනාකමකට තක්සේරු කර තිබීම හේතුවෙන් කමිටු සාමාජිකයින් හා විෂයභාර නිලධාරියා විසින් රජයට ආර්ථික පාඩුවක් සිදුකිරීමේ අරමුණින් සිතාමතා කටයුතු කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | පිළිගනිමි. | වටිනාකමට තක්සේරු කිරීම පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු කටයුතු හා ක්‍රියාමාර්ග ගතයුතුය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යභාරයන් ඉටු නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/04 දරන චක්‍රලේඛයේ 1.3.2 උප වගන්තියේ (ඊ) ඡේදයේ හා 2020 පෙබරවාරි 03 දිනැති අංක2008/04(1) චක්‍රලේඛයේ 03 වගන්ති ප්‍රකාර රජයේ ඉඩම් ලබා ගැනීම සඳහා සුදුසු තැනැත්තන් තෝරා ගැනීමේ ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දින සිට මාස 03ක් ඇතුලත බලපත්‍ර සකස් කර ඉල්ලුම්කරුවන් වෙත ලබා දීමට කටයුතු කල යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11ක් මගින් ප්‍රතිලාභීන් 1,826ක් වෙත බලපත්‍ර ලබා දීමට වසර 01 සිට වසර 05ක් දක්වා කාලයක් ලබාගෙන තිබුණි. | ඉඩම් රාජකාරී සඳහා දින යොදා ගත්තද, ඒවා නිසි පරිදි ක්‍රියාත්මක නොවීම පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමු කරන ලේඛන විවිධ අඩුපාඩු මත ආපසු හරවා එවීම නිසා ප්‍රමාද වී ඇත. | රජයේ ඉඩම් සඳහා බලපත්‍ර ලබාදීම ප්‍රමාදයකින් තොරව සිදුකළ යුතුය. |
| (ආ) | මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05කට අදාලව 1995 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා දීර්ඝකාලීනව බදු වශයෙන් ප්‍රතිලාභීන් 30 දෙනෙකුගෙන් අයවිය යුතු රු.116,517,935ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | බදු අයකරගැනීම සඳහා නිශ්චිත වැඩපිළිවලක් සකස්කර ඇති අතර, බදු ගෙවීම පැහැර හරින්නන්ගේ බදු අනුමැතිය අවලංගු කර ඉඩමේ අයිතිය රජය වෙත ලබාගැනීමට කටයුතු කරයි. | අයවිය යුතු දීර්ඝකාලීන බදු මුදල් කඩිනමින් අයකරගැනීමට කටයුතු කලයුතුය. |
| (ඇ) | මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04ක 2015 වර්ෂයේ සිට රජයේ ඉඩම් අනවසර අල්ලා ගැනීම් 79ක් වාර්තා වී තිබූ අතර, ඒ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන නෙරපීමේ නියෝග ක්‍රියාත්මක කිරීමට හෝ සන්තකය ආපසු භාර ගැනිමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වගකිව යුතු නිලධාරීන් විසින් කටයුතු කර නොතිබුණි. | අනවසර අල්ලාගැනීම් සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් කරන ලෙස ග්‍රාම නිලධාරීන්ට උපදෙස් දී ඇත. | නෙරපීමේ නියෝග ක්‍රියාත්මකව කිරීම හෝ සන්තකය ආපසු භාරගැනීමට කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09ක රජයේ ඉඩම් අත්පත්කර ගැනීම් 59ක් සම්බන්ධයෙන් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලීන් සඳහා වසර 03 ක සිට වසර 48ක් දක්වා කාලයක් ගත වී තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | ඉතා පැරණි ගොණු පිළිබඳ නැවත අධ්‍යනය කිරීමට සිදුවීම නිසාත් ඉල්ලුම්කරුවන් ජීවතුන් අතර, නොසිටීම නිසාත් ප්‍රමාද වී ඇත. | රජයේ ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව කිරීමට කටයුතු කළයුතුය. |
| (ඉ) | මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 34 දෙනෙකු වෙත මධ්‍යම පාන්තික ගෘනුම් මිල යටතේ රු.5,594,500ක වටිනාකමට වාර්ෂික බලපත්‍ර 34ක් 2019 වර්ෂයේ සිට නිකුත් කර තිබුණද,සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් රු.4,529,750ක මුදලක් තවදුරටත් අයවීමට තිබුණි. | ගෘණුම්කරුවන්ට ගෙවීම් සිදුකරන ලෙස ලිපි මගින් සහ දුරකථන මාර්ගයෙන් දැනුවත් කර ඇත. | ගෘණුම් මිල අයකිරීමට කාර්යක්ෂම කටයුතු කලයුතුය. |

## 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 හි තෝරාගත් සමෘද්ධි ප්‍රතිලාභීන් 110ක් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී වසර 08 සිට වසර 28ක් දක්වා කාලයක සිට සමෘද්ධි ප්‍රතිලාභ ලබමින් සිට තිබූ අතර, වර්තමානයේ අස්වැසුම ප්‍රතිලාභ හිමිකමද හිමිව ඇතත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ඔවුන්ගේ දිළිඳුභාවය අවසන් කර ආර්ථිකය නගාසිටුවීම සඳහා රාජ්‍ය නිලධාරීන්ට මෙන්ම ප්‍රතිලාභියාටද නොහැකි වී තිබුණි. | එක් එක් පුද්ගලයාගේ පෞද්ගලික හේතු මත ආර්ථිකය නඟා සිටුවීමට අවස්ථාවක් නොමැත. | නිරන්තරයෙන් ප්‍රතිලාභ මත රැඳී නොසිට ප්‍රතිලාභීන්ගේ ආර්ථිකය නඟා සිටුවීමට කටයුතු කලයුතුය. |
| (ආ) | 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා විවිධ වැඩසටහන් යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක් වෙත ලැබී තිබුණු රු.1,064,219ක් වටිනා ප්ලාස්ටික් පුටු 936ක්, කඩබ් 04 ක්, සිංගර් මහන මැෂින් 03ක්, උද්‍යාන කුඩ 08ක්, තණකොළ කපන මැෂින් 01ක් හා ජල පෙරණ 03 ක් ලෙස උපකරණ ඒකක 955ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිලාභීන් වෙත බෙදා නොහැර ගබඩාවල රඳවාගෙන තිබුණි. | භාණ්ඩ බෙදාදීමට කඩිනමින් කටයුතු කරමි. | විවිධ වැඩසටහන් යටතේ ලැබුණු භාණ්ඩ කඩිනමින් ප්‍රතිලාභීන්ට බෙදාදීමට ක්‍රියාකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 හා 2022 වර්ෂවල ක්‍රියාත්මක කර තිබූ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 03 ක කෘෂි බීජ නිෂ්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.5,214,849 ක් වැයකර තිබූ අතර, නිෂ්පාදන ගම්මානයේ කිසිවකු විසින් බීජ නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිගනිමි. | බීජ සහතික කිරීම සාර්ථකව ක්‍රියාත්මක කලයුතුය. |

### 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02ක 2019 හා 2020 වර්ෂයේ ගංවතුර, නායයෑම් හා අධිඅවදානම් හේතුවෙන් තම පදිංචි ස්ථානයෙන් ඉවත්කර නැවත පදිංචි කිරීම සඳහා තෝරාගත් ප්‍රතිලාභින් 13 දෙනෙකු වෙත එකතුව රු.21,000,000ක් ගෙවා තිබුණත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නැවත පදිංචි කිරීම සිදුකර නොතිබුණි. | ප්‍රතිලාභීන්ට විවිධ හේතූන් නිසා ව්‍යාපෘතිය නිමකර ගැනීමට නොහැකි වී ඇත. | ප්‍රතිලාභීන් අවදානම් ප්‍රදේශවලින් ඉවත් කිරීමට කඩිනමින් කටයුතු කළයුතුය. |

### 3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කැබිලිත්ත ප්‍රදේශයේ ඉඩම් මැනීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.21,960,000ක් වැයකර තිබුණද, ව්‍යාපෘතියේ ප්‍රගතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ඇතුලත් කර නොතිබුණි. | වාර්ෂික කාර්යසාධන වාර්තාවට ඇතුලත් කිරීමට කටයුතු කරමි. | 2023 වාර්ෂික කාර්ය සාධන වාර්තාවට ඇතුලත් කිරීමට කටයුතු කලයුතුය. |

## 3.5 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 ජනවාරි 27 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1.4 උප වගන්තිය ප්‍රකාරව උසස් ගුණාත්මකභාවයක් සහිතව අවම පිරිවැයක් දැරීමේ ප්‍රතිඵලයක් ලෙස උපරිම ආර්ථික වාසි සලසාගැනීමේ අරමුණින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කලයුතු වුවත්, එසේ කටයුතු නොකර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලෝක ආහාර වැඩසටහන යටතේ උපකරණ හා ද්‍රව්‍ය මිලදීගැනීම වෙනුවෙන් රු.8,711,734ක් වැයකර තිබුණි. | කමිටු අනුමැතිය ලබාගෙන ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කලයුතුය. |

## 3.6 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 770(4) ප්‍රකාරව රජයේ අමාත්‍යාංශ වල අබලන් වූ භාවිතයට ගත නොහැකි වාහන හඳුනාගෙන අපහරණය කිරීමට කටයුතු කළ යුතු වුවත්, දීර්ඝ කාලයක සිට අපහරණය කිරීමට හඳුනාගෙන තිබුණු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 05ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන 05 සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරමි. | වාහන අපහරණය ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 13ක් සහ අයිතිය සම්බන්ධයෙන් තහවුරු නොවූ වාහන 03ක් වසර 04ක පමණ සිට ධාවනය කර නොතිබුණු අතර එම වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාදවී තිබීමෙන් වාහනවල ආර්ථිකමය වටිනාකම අඩුවී රජයට අයකර ගත හැකි ආදායම අහිමි වී තිබුණි. | ඉදිරි ක්රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමේ කටයුතු කඩිනම් කල යුතුය. |

## 3.7 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව අවසන් පරීක්ෂණ වාර්තාව, අලාභ හානිය සිදුවූ දිනයේ සිට මාස 03 ක් ඇතුලත ඉදිරිපත් කලයුතු වුවත්, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ්රථය 2020 නොවැම්බර් 11 දින අනතුරට පත්වීම නිසා රු.664,400ක අලාභයක් සිදුවී තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අවසන් පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල අලාභ හානි යටතේ ද දක්වා නොතිබුණි. | කමිටු වාර්තා ලැබීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගනිමි. | මුදල් රෙගුලාසි පරිදි දැක්විය යුතු හානි හා පාඩු මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කලයුතුය. |

## 3.8 කළමනාකරණ දූර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 10ක විශ්‍රාම වැටුප් ලබන ප්‍රතිලාභීන් 50 දෙනෙකු වෙත විශ්‍රාම වැටුප් ලෙස 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු.12,636,910ක් වැඩිපුර ගෙවා තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් රු.7,327,607ක මුදලක් තවදුරටත් අයවීමට තිබුණි. | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 9/2008 හා විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 6/2019 අනුව වැඩිපුර විශ්‍රාම වැටුප් ගෙවීමට සිදුවී ඇත. | වැඩිපුර ගෙවීම ආපසු අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2022/23 මහ කන්නයේ රජය වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10ක් විසින් රු. 1,049,189,326 ක් වැයකර වී කිලෝග්රෑම් 9,335,360ක් මිලදීගෙන සහල් බවට පත්කර ප්‍රතිලාභීන් වෙත බෙදාහැරීමේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04ක් පිළියල කර තිබූ ප්‍රතිලාභී තෝරාගත් පදනම තහවුරු නොවුණි. තවද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක නිත්‍ය නාමලේඛන වලින් බැහැර වෙනත් නාමලේඛන සඳහා සහල් බෙදාහැරීම සිදුකර තිබුණු අතර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 ක පළමු වටයේ සහල් බෙදාහැරීමේ නාමලේඛන දෙවන වටයේදී වෙනස්කිරීමට ලක්කර තිබුණි. | පිළිගනිමි. | ප්‍රතිලාභීන් තෝරාගත් පදනම විගණනයට ඉදිරිපත් කළයුතුය. තවද, නිත්‍ය නාමලේඛන සකස් කලයුතු අතර නාමලේඛන වෙනස් කිරීම සම්බන්ධව සුදුසු පියවර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022/2023 මහ කන්නයේ තෝරාගත් ප්‍රතිලාභීන් වෙත සහල් බෙදාහැරීමේදී වටිනාකම රු.4,976,460ක් වූ අත්සන් ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක රු.466,693,364ක් වූ ගණුදෙනු සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | පිළිගනිමි. | සහල් බෙදාහැරීමට අදාළ අත්සන් ලේඛන ඉදිරිපත් කලයුතුය. |
| (ඈ) | මොනරාගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් අංක 04 පරිපාලන නිලධාරි නිල නිවාසය 2003 වර්ෂය සිට 2015 වර්ෂය දක්වා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හා අමාත්‍යවරියන් වෙත සම්බන්ධීකරණ කාර්යාලයක් පවත්වාගෙන යාම වෙනුවෙන් ලබාදී තිබූ අතර, එම කාලපරිච්ඡේද වෙනුවෙන් අයකර ගත යුතුව තිබූ රු.356,400ක නිවාස කුලී හා ජල ගාස්තුව රු.33,591ක් වශයෙන් එකතුව රු. 389,991ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. අයකරගැනීමට ලිපි යොමු කර ඇත. | හිඟ නිවාස කුලී හා ජල ගාස්තු කඩිනමින් අයකරගත යුතුය. |
| (ඉ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා නිලධාරීන් 24 කගෙන් අයවිය යුතු හිඟ නිවාස කුලී රු.496,375 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවතුන අතර නිලධාරීන් 21 කගෙන් අයවිය යුතු රු.415,998ක් එකී නිලධාරීන් විශ්‍රාම යාම හා ස්ථාන මාරුවීම් ලැබීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගැනීමට නොහැකි වී තිබුණි. | පිළිගනිමි. | හිඟ නිවාස කුලී කඩිනමින් අයකර ගතයුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

**4.1 තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගැනීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයේ 2030 ට අනුව ළඟාකර ගත යුතු අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමේ සූදානම පිළිබඳ පරීක්ෂාවේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 සම්බන්ධයෙන් 2023 වර්ෂය තුළදී නිසි අවධානය යොමුකර නොතිබුණු අතර, වර්ෂය තුල ලද ප්‍රතිපාදන මත පදනම්ව තිරසාර සංවර්ධන අරමුණු 06ක් හඳුනාගෙන තිබුණත්, තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030ට අනුව අරමුණු 11ක් කෙරෙහි නිසි අවධානය යොමුකර නොතිබුණි. | ඉලක්ක සපුරාගැනීමේදී විවිධ ගැටළුවලට මුහුණ දීමට සිදුවිය. | තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා සපුරාගැනීමට ක්‍රියාකළ යුතුය. |

## 4.2 තිරසාර සංවර්ධන අරමුණු ඉටුකිරීමේ ප්‍රගතිය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | දිස්ත්‍රික්කය හා එහි ජනතාව ජාතික සංවර්ධනයට දායක වන පරිදි තිරසාර සංවර්ධනයක් උදෙසා රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූල වූ මනා සැලැස්මකින් යුතුව සම්පත් හා ආයතන ඵලදායී ලෙස මෙහෙයවන්නා වූ මනා සම්බන්ධීකරණයක් තුලින් ජනතා අවශ්‍යතා කාර්යක්ෂමව, සාධාරණව, යුක්තිගරුකව හා මිත්‍රශීලිව ඉටුකිරීම ආයතනයේ මෙහෙවර වුවත්, මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් කාර්යසාධන දර්ශක සපුරාගෙන නොතිබුණි. | | |
| (අ) | අලුත් ගමක් අලුත් රටක් වැඩසටහනයට තේ ඉඩම් අයිතිය නීත්‍යානුකූල කිරීමේ ප්‍රගතිය සියයට 50ක්ද, දිස්ත්‍රික් ඉඩම් අංශයට අදාලව ඉඩම් සඳහා බලපත්‍ර සකස්කිරීමේ ප්‍රගතිය සියයට 22ක්ද, ඉඩම් සඳහා දීමනා පත්‍ර සකස්කිරීමේ ප්‍රගතිය සියයට 1ක්ද, දීර්ඝකාලීන බදු බලපත්‍ර සකස්කිරීමේ ප්‍රගතිය සියයට 7ක්ද, නිදහස් දීමනා පත්‍ර සකස්කිරීමේ ප්‍රගතිය සියයට 17ක්ද, රජයේ ආයතන සඳහා ඉඩම් පවරාදීමේ ප්‍රගතිය සියයට 24ක් හා ඉඩම් ගැටළුවලට විසඳුම් ලබාදීමේ ප්‍රගතිය සියයට 42ක් වශයෙන් දර්ශකවල ප්‍රගතිය අවම මට්ටමක පැවතුණි. | රාජ්‍ය ආයතනවල එකඟතාවය ලබාගැනීමට නොහැකි වීම් හා ප්‍රමාදවීම, විශාල මැනුම් ඉල්ලීම් ප්‍රමාණයක් යොමුකර තිබීම නිසා අදාල ප්‍රගතිය ලබාගැනීමට නොහැකි වී තිබුණි. | කාර්යසාධන දර්ශක ප්‍රගතිය වර්ධනය කරගැනීමට තිබූ බාධක හඳුනාගෙන ඒවා ජයගැනීමට ක්‍රියාකළයුතුය. |
| (ආ) | තරුණ කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධනයේ ප්‍රගතිය සියයට 55ක්ද, විදේශ රැකියා ප්‍රවර්ධන අංශයේ විදේශ රැකියා වෙත යොමුකිරීමේ ප්‍රගතිය සියයට 63ක් ද, විදාතා සංවර්ධන කටයුතු යටතේ තත්ත්ව පරීක්ෂණ වාර්තා හා ප්‍රමිති සහතික ලබාදීමේ ප්‍රගතිය සියයට 52ක්ද, නව නිපයුම් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රගතිය සියයට 10ක්ද, සංචාරක කටයුතු ප්‍රවර්ධන ඒකකය යටතේ සංචාරක ආකර්ශනීය ස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ප්‍රගතිය සියයට 10 ක් ද, වූ අතර, එම කාර්ය සාධන මට්ටම් ඉහල නංවාගැනීම සඳහා අවධානය යොමුකර නොතිබුණි. | වෘත්තිය සුදුසුකම් නොතිබීම, මූල්‍ය හැකියාව නොතිබීම, භාෂා ප්‍රවීනතාවය නොමැතිවීම, ඉලක්ක සපුරාගැනීමේදී ගැටළුකාරී වී ඇත.<br><br>විදාතා සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් භාණ්ඩවල ගුණාත්වය අඩුවීම .<br><br>අමතර මූල්‍ය වියදම් නිෂ්පාදකයින්ට දැරීමට නොහැකි වීම. | කාර්යසාධන දර්ශක ප්‍රගතිය වර්ධනය කරගැනීමට තිබූ බාධක හඳුනාගෙන ඒවා ජයගැනීමට ක්‍රියාකළයුතුය. |

| | | |
|---|---|---|
| | සංචාරක ආකර්ශනීය ස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනයට ප්‍රතිපාදන නොලැබීම. හේතු වී ඇත. | |

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව උපරිම කාලසීමාව අවුරුදු 05 ක් එකම සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියකුම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරුවීම් ලබාදිය යුතු වුවද, මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරින් 30ක් සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11ක සේවයේ නියුතු නිලධාරීන් 731ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් වර්ෂ 06 ක සිට වර්ෂ 33ක් දක්වා කාලපරාසයක එකම සේවා ස්ථානයේ සේවයේ යෙදී සිටී තිබුණි. | 2024 වර්ෂයේදී ස්ථානමාරුවීම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී. | සේවා කාලය වසර 05 ඉක්මවූ නිලධාරීන් ස්ථානමාරු කලයුතුය. |
| (ආ) 2023 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තනතුරු 14කට අදාලව නිලධාරින් 27කගේ ඌණතාවයක් හා තනතුරු 01කට අදාලව නිලධාරීන් 34කගේ අතිරික්තයක්ද, මොනරාගල දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11 ක තනතුරු 14 කට අදාලව නිලධාරින් 148කගේ ඌණතාවයක්ද, තනතුරු 02කට අදාලව නිලධාරින් 191කගේ අතිරික්තයක්ද පැවතුණි. | පිළිගනිමි. | අතිරික්ත හා ඌනතා තුලනය කර ගැනීමට කටයුතු කළයුතුය. |